# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1853/2 – 2014 මාර්තු 10 වැනි සඳුදා – 2014.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වම් ඇළේ සිට අතු ඇළ ඉදිකිරීම සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බලදොර කෝරළේ සුළු කොට්ඨාසයේ, පහල හල්මිල්ලකොටුව (අ.ග.පි. 1673) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කු/කේබීඅයි/2013/368 සහ 2013.08.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.9139ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කිතුල්ගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.6307ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, එච්. එම්. බණ්ඩාරතිලක හිමිකම් කියන මීනීපිටියේහේන (කිතුල්ගහමුලහේන) සහ කැබලි අක්ෂර බී; දකුණට: එච්. එම්. බණ්ඩාරතිලක හිමිකම් කියන මීනීපිටියේහේන (කිතුල්ගහමුලහේන) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: වල්පාළුව (අ. ග. පි. 1736).

02. **කැබලි අක්ෂර 'බී' – මීනීපිටියේහේන සහ කිතුල්ගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.2625ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: හැළඹවැව සහ කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර සී, මීනීපිටියේහේන සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: ජී. එච්. එම්. ද සිල්වා හිමිකම් කියන කිතුල්ගහමුලහේන සහ කැබලි අක්ෂර ඒ.

03. **කැබලි අක්ෂර 'සී' – මීනීපිටියේහේන – ප්‍රමාණය: හෙක්. 0.0207ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර බී; නැගෙනහිරට: හැළඹවැව; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ එච්. එම්. බණ්ඩාරතිලක හිමිකම් කියන මීනීපිටියේහේන සහ කැබලි අක්ෂර බී.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2012/අයිආර්/28.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංකය: 3/6/8/8.
2014 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 671